## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/11/2025 (PSC)**

ජේ.එම්.සී.අයි.ජයසිංහ

**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.03.03**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.වී.වයි.ආර්.ගුණරත්න මහත්මිය.

**-නියෝගය-**

දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු.

අභියාචක වන ජේ.එම්.චමිල ඉන්දික ජයසිංහ යන අය විසින් 2025.01.20 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙහි ඔහු සඳහන් කර ඇත්තේ, 2024.12.04 දිනැතිව නිකුත් කරන ලද විනය නියෝගයට එරෙහිව මෙම අභියාචනය ඉදිරිපත් කළ බවයි. එකී විනය නියෝගය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2024.12.04 දිනැති ලිපියේ සඳහන්ව ඇත. එම ලිපියට අනුව අභියාචකගේ වැටුප් වර්ධක හතරක් විලම්භනය කිරීමට තීරණය කර ඇත. එම තීරණයට එළඹී ඇත්තේ, 2023.02.03 දින නිකුත් කරන ලද චෝදනා පත්‍රයට අදාළව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙනි.

අභියාචකට එරෙහිව චෝදනා හතරකින් සමන්විත 2022.02.03 දිනැති චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත. එම චෝදනා පත්‍රයට අනුව පහත සඳහන් චෝදනා හතර අභියාචකට එරෙහිව නිකුත් කර ඇත.

I. *ඔබ, 2019.06.20 දින හෝ ඊට ආසන්න දිනකදී පස්වරු කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ ධනසිරි නිවස, සීලතැන්න ලිපිනයේ පදිංචි විජේසේකර මුදියන්සේලාගේ ආසිරි චමිත් ඉන්දික මයාගේ නිවසට ඔහුගේ අවසරයකින් තොරව ඇතුළු වීම තුළින්, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිළධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.*

II. *ඔබ, 2019.06.20 දින හෝ ඊට ආසන්න දිනකදී පස්වරු කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ ධනසිරි නිවස, සීලතැන්න ලිපිනයේ පදිංචි විජේසේකර මුදියන්සේලාගේ ආසිරි චමිත් ඉන්දික මහතාට පහර දී තුවාල සිදු කිරීම තුළින්, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිළධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.*

III. *ඔබ, 2019.06.20 දින හෝ ඊට ආසන්න දිනකදී පස්වරු කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ ධනසිරි නිවස, සීලතැන්න ලිපිනයේ පදිංචි විජේසේකර මුදියන්සේලාගේ ආසිරි චමිත් ඉන්දික මයාගේ බිරිඳ වන චමිලා සජීවනී මිය රාත්‍රී කාලයේ නිවසින් පිටතට කැඳවාගෙන යාමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.*

IV. *ඔබ, ඉහත චෝදනා අංක I, II හා III, හි සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ සිදු කිරීම මඟින් රාජ්‍ය නිලධාරියෙකු වශයෙන් ඔබ දරණ තනතුරත්, පොදුවේ සමස්ත රාජ්‍ය සේවයත් අපකීර්තියට පත් කර ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.*

ඉහත කී චෝදනා සියල්ලටම හේතු වී ඇත්තේ, අභියාචක විසින් ආසිරි චමිත් ඉන්දික යන අයගේ නිවසට ගොස් එම අයට පහර දී, ඔහුගේ බිරිඳ වන චමිලා සජීවනී යන අය රාත්‍රී කාලයේදී ඇයගේ නිවසින් පිටතට රැගෙන ගොස් තිබීමයි. එම චෝදනා ඔප්පු කිරීම සඳහා වන එම්.ආර්.රංජිත්, ජයසේකර චාමින්ද, එස්.ජගත් චන්ද්‍රසිරි ලියනගේ, ආර්.එම්.චමිලා සජීවනී, ආර්.ඒ.චන්දන උපුල්, ආර්.එම්.චන්ද්‍රසිරි රත්නායක, ආසිරි චමිත් ඉන්දික යන අය ඇතුළු සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුගේ සාක්ෂි ඉදිරිපත් කර ඇත. ආසිරි චමිත් යන සාක්ෂිකරු, අභියාචක විසින් ඔහුට පහර දී තුවාල සිදුකළ බවට සාක්ෂි දී ඇත. ඒ සම්බන්ධයෙන් අභියාචකට එරෙහිව බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක්ද පැවරීමෙන් අනතුරුව එම චෝදනාව දෙපාර්ශවයේ එකඟත්වයෙන් සමථයට පත් කර, අභියාචක විසින් ඉහත කී ආසිරි චමිත් ඉන්දික යන අයට වන්දි මුදලක්ද ගෙවා ඇත.

එම කරුණු මතම අභියාචක විසින් ආසිරි චමිත් ඉන්දික යන අය පහරදුන් බව සනාථ වනවා ඇත. එවැනි පහර දීමක් අභියාචක විසින් සිදු නොකළේ නම්, ඔහු විසින් එම තැනැත්තාට වන්දි මුදලක් නොගෙවා සිටීමට තිබුණි. ඉදිරිපත් වී ඇති සියළුම සාක්ෂිකරුවන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිළි සාක්ෂි ඉදිරිපත් කර ඇත. කෙසේ නමුත් චමිලා සජීවනී යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඇයගේ ස්වකැමැත්තෙන් ඇයගේ දෙමාපියන්ගේ නිවසට යාමට අභියාචක සමඟ පිටත්ව ගිය බවයි. එම කරුණු කෙරෙහි අවධානය යොමු කළත් පෙනී යන්නේ, එදින රාත්‍රී කාලයේදී අභියාචක සේවය කරන කාර්යාලයේ සේවය කරන සේවකයකු වී සිටි චමිලා සජීවනී යන අයව, ඇයගේ කැමැත්ත මත හෝ ස්වාමිපුරුෂයාගේ නිවසින් බැහැරව ගෙන යාම අනුමත කළ නොහැකි බවයි.

ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමෙන් පසු පෙනී යන්නේ, සිද්ධිය වූ අවස්ථාවේදී, ආසිරි චමිත් ඉන්දික යන අයගේ නිවස පිහිටි ස්ථානයට මෙම අභියාචක ගොස් ඇති බවට පැහැදිළිව සනාථ වී ඇති බවයි. ඒ සමඟම අභියාචක විසින් එම අයට අධිකරණයේදී වන්දි මුදලක් ගෙවීමෙන් පැහැදිළි වන්නේ, අභියාචක විසින් ඔහුට පහර දීමක් සිදු කර ඇති බවයි. ආසිරි චමිත් යන අයගේ

බිරිඳ වන චමිලා සජීවනී යන අය අභියාචකගේ යතුරු පැදියෙන් එම ස්ථානයෙන් ඉවත් කර ගෙන යාම ද පැහැදිලිව සාක්ෂි මඟින් සනාථ වී ඇත.

ඒ අනුව ඉදිරිපත් කර ඇති චෝදනා තුනම පිළිගත හැකි සාක්ෂි මඟින් සනාථ වී ඇති බව පෙනී යයි. IV වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, I සිට III දක්වා වන චෝදනාවන් ඔප්පු වීම මතය. එම චෝදනා තුනම ඔප්පු වී ඇති බවට දැනටමත් තීරණය කර ඇති නිසා, චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා හතරටම ඔහු වරදකරු කරමින් ගෙන ඇති තීරණයේ දෝෂයක් පෙනෙන්නට නැත.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/